
# හිත හොඳ ඔවිනි



විදුනි බමුණුහේන්ද්‍ර

# හිත හොඳ ඔවිනි

විදුනි බමුණුහේන්ද්‍ර

**හිත හොඳ ඔච්චි**

විදුනි බමුණුහේන්ද්‍ර

© කර්තෘ ප්‍රකාශනයකි


| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | : 2025 ජනවාරි |
| ISBN | : 978-624-208-267-7 |
| කර්තෘ | : විදුනි බමුණුහේන්ද්‍ර |
| චිත්‍ර | : විදුනි බමුණුහේන්ද්‍ර |
| පරිගණක අක්ෂර සහ ග්‍රැෆික් නිර්මාණයකරණය | : නෙත්වින් ප්‍රින්ටර්ස් |
| මුද්‍රණය | "දළදා සෙවනේ අපි" පදනම, ගැටඹේ හන්දිය, පේරාදෙණිය 081 2 386 908 |
| කර්තෘගේ වෙනත් කෘති | : දඟකාර අලි පැංචා - 2024 |

# පිදුම

සිප්සතර හැදෑරීමට මහාමායා විදුබිමට පැමිණ අත්පොත් තැබූ මා හට සිප්සයුරේ කිමිද, සියල්ල අතැඹුලක් සේ දැනගැනීමටත්, යහපත් මහාමායා දියණියක සේ මාගේ ජීවිතය අර්ථවත් කර ගැනීමටත්, ගුරුමෑණියනි, ඔබතුමියගේ ඔවදන් සහ මගපෙන්වීම මහත් පිටුවහලක් විය.

එසේ හෙයින් මාගේ පන්තිභාර ගුරුමෑණියන් වන වත්සලා අමරසේන ගුරුමෑණියන්ට තුති සිතින් ඉතා ගෞරවණීය ලෙස මාගේ මේ පොත් පිංච පුදදෙමි.

# ස්තූතිය

මා විසින් දෙවන වරට ලියන ලද කෘතිය වන "හිත හොඳ ඔච්චි" නම් මෙම පොත් පිංච සාර්ථකව නිම කිරීම සඳහා මා හට ගුරුහරුකම් දෙමින් මාව දිරිමත් කළ මාගේ ආදරණීය දෙමාපියන්ටත්, විදුහල්පතිතුමිය වන ශෂිකලා සේනාධීර ගුරුමෑණියන්ටත්, ව්‍යාපෘති නිර්මාතෘ, සම්බන්ධීකාරක - සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන්ටත්, මාගේ පන්තිභාර ගුරුතුමිය වන වත්සලා අමරසේන ගුරු මෑණියන්ටත්, මෙම කෘතිය සාර්ථකව නිම කර ගැනීම සඳහා අතහිත දුන් සැමටත් මාගේ ගෞරවාදර ස්තූතිය මෙයින් පුද කරමි.

විදුනි බමුණුහේන්ද්‍ර

3 ශ්‍රේණිය B


# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන .හෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


ඔන්න එකමත් එක ගමක හිටියා පොඩි ගැණු ළමයෙක්. එයාගේ නම තමයි ඔවිනි. එයා හරිම ගුණ යහපත්.




දවසක් මේ ඔවිනි එයාගේ ගෙදර ළඟ තියෙන කැලෑවට ගියා සෙල්ලම් කරන්න. එයා ඒ කැලේ ගස් කොළන් වලට හරිම ආදරෙයි.



ඔවිනි සෙල්ලම් කරනකොට අමුතු ශබ්දයක් ඇහුණා. ඇය ටිකක් කලබල වෙලා ඒ ශබ්දයට ඇහුම්කන් දුන්නා.





එයාට ඒ ඇහිලා තියෙන්නේ ගස් දෙකක් කතා කරන ශබ්දය. ඒ ගස් කතා කළේ මොනවද කියලා පුංචි යාළුවෝ දන්නවද ?


කොස් ගස :- අනේ අඹ ගස පහුගිය දවස්වල අපි ඉතාම හොඳින් සතුටින් කාලය ගත කළා. දැන් මට ඔයාගෙන් ඈත් වෙලා යන්න වෙනවා.

අඹ ගස :- හා නේ, ඒ මොකද ඒ?





කොස් ගස :- ලී ගන්න අපිව කපාගෙන යනවා කියල කට්ටියක් කතා වුණා.

මේ දෙන්නගෙ කතාව ඔවිනිට ඇහුනා. එයා ගෙදර ගිහින් මේ කතාව එයාගේ දෙමව්පියන්ටත් කිව්වා. ඒ වගේම ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන්ටත් කිව්වා.




ලොකු හාමුදුරුවෝ මේ පුංචි ඔවිනිට මෙහෙම කිව්වා, "දුව ඔයා හොඳ ළමයෙක්. පරිසරය ගැන හොඳ අවධානයෙන් ඉඳලා තියෙනවා. ඒකයි ඔයාට ගස් කතා කරනවා ඇහුනේ. ඔය ළමයා දැන් ගෙදර යන්න. මං ඒ ගස් කපන අයට එපා කියන්නම්," කියලා ලොකු හාමුදුරුවෝ කිව්වා.





ලොකු හාමුදුරුවෝ කිව්ව පණිවිඩය ඔවිනි ඒ ගස්වලට කිවුවා.

ලොකු හාමුදුරුවන්ගේ උපදෙස් අහල ගස් කපන අය ලී වෙනුවට යකඩෙන් නිවසේ වහල හැදුවා.



ඊට පස්සේ ගස් ගමේ මිනිස්සුන්ට හෙවන දුන්නා, පලතුරු දුන්නා. මිනිස්සුයි, ගසුයි-වැලුයි හරි සතුටින් ජීවත් වුනා.

# කවිය

හොඳ හිතක් ඇත්නම්,

වනයට ආදරෙයි නම්,

සැමදා එය රකී නම්,

පුංචි අපටත් ලැබෙයි ඇගයුම්...

# පසුවදන


රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

විදුනි බමුණුහේන්ද්‍ර
- කර්තෘ -



9 786242 082677